සියලුම හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜீனை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව<br>Economics -I | 21 S I | කාලය පැය දෙකයි<br>02 hours |

සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

අංක 1 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

01. ආර්ථික විද්‍යාවේ 'හිඟකම' නැමැති කේන්ද්‍රීය ප්‍රශ්නය පැන නැගීමට හේතුවන කරුණක් වන්නේ,
    1. ආර්ථිකයක් සතු සම්පත් උපයෝජනයට අවශ්‍ය ආයෝජන අවස්ථා සලසා නොමැති වීමයි.
    2. සම්පත් සම්භාරයේ සීමිත බව අභිබවා මිනිස් වුවමනාවන් පැන නැගීමයි.
    3. භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් මිනිස් වුවමනා තෘප්තිමත් නොවීමයි.
    4. මූලික මිනිස් අවශ්‍යතාවන් සමඟ මානසික හා සමාජීය අවශ්‍යතා පැන නැගීමයි.
    5. බොහෝ රටවල දිළිඳු ජනකොටස් සහනාධාර ලබමින් ජීවත්වීමයි.

(...............)

02. නිෂ්පාදන ක්‍රියාවලියට ආධාර කෙරෙන ස්ථාවර ප්‍රාග්ධනයේ ප්‍රධාන සංරචකයක් නොවන්නේ පහත දෑ අතුරෙන් කවරේද?
    1. ඛනිජ සම්පත් ගවේෂණය
    2. පරිගණක මෘදුකාංග
    3. මත්ස්‍ය වගාව
    4. අර්ධ නිමි භාණ්ඩ තොග
    5. ප්‍රවාහක යාත්‍රා

(...............)

03. මූලික ආර්ථික ප්‍රශ්නයක් ලෙස "සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳ ප්‍රශ්නය" යන්නෙන් අදහස් කරන්නේ,
    1. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා කවර සම්පත් යෙදවිය යුතු ද යන්නයි.
    2. සීමිත සම්පත් යොදා කවර වුවමනාවක් සපුරා ගන්නේද යන්නයි.
    3. නිෂ්පාදනයේ දී විකල්ප තුළ ශිල්ප අතුරෙන් වඩා යෝග්‍ය ශිල්ප ක්‍රමය තෝරාගත යුතු ද යන්නයි.
    4. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා සමාජයේ කවර පුරවැසියන් අතර බෙදා හැරිය යුතු ද යන්නයි.
    5. රටේ සමස්ත ආදායම සමාජයේ පුරවැසියන් අතර බෙදා හරින්නේ කෙසේ ද යන්නයි.

(...............)

04. ද්‍රව්‍යාත්මක ප්‍රතිලාභ පදනම් කරගත්
1. මිශ්‍ර ආර්ථික පද්ධතිය
2. සම්ප්‍රදායික ආර්ථික පද්ධතිය
3. සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය
4. විධාන ආර්ථික පද්ධතිය
5. වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය (..............)


05. ආර්ථික පද්ධතියක් තුළ ව්‍යාපාරික අංශය සතු කාර්යය භාරයක් වන්නේ,
1. පරිසර සංරක්ෂණය කිරීම.
2. කුමක්, කොපමණ, කෙසේ. කා සඳහා නිපදවිය යුතු ද යන්න. තීරණය කිරීම.
3. භාණ්ඩ හා සේවා මිලදී ගැනීම පිළිබඳ තීරණය කිරීම.
4. කර්මාන්ත හා ව්‍යාපාර නියාමනය කිරීම.
5. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

(..............)

06. ප්‍රධාන ආර්ථික විද්‍යා සංකල්පයක් වනුයේ,
1. නිෂ්පාදන කාර්යක්ෂමතාවය
2. ඌන සම්පත් උපයෝජනය
3. ආර්ථික අවපාතය
4. වර්තමාන හා අනාගත පරිභෝජනයට සම්පත් බෙදා වෙන් කිරීම.
5. ආර්ථික පසු බැසීම.

(..............)


07.




ඉහත රූප සටහනට අනුව එක්තරා ආර්ථිකයක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය තුළ U ලක්ෂ්‍යයේ කටයුතු කරයි. මෙයින් අදහස් කරන්නේ
1. නිෂ්පාදන සම්පත් විනාශ වීමයි.
2. ශ්‍රම ඵලදායිතාවයේ පසු බැසීමයි.
3. තාක්ෂණික දියුණුවක් හට ගැනීමකි.
4. සිවිල් යුද්ධයක් පැවතීමයි.
5. ශ්‍රමිකයින් විරැකියාවෙන් පසුවීමකි. (..............)

08. තරඟකාරී සහල් වෙළෙඳපොළක ඉල්ලුම හා සැපයුම තත්වයක් පහත දැක්වෙන ප්‍රස්තාර සටහනෙන් පෙන්නුම් කෙරේ.

ප්‍රස්තාර සටහනට අනුව සහල් මිල ඉහළ යාමට බලපෑ හැකි හේතුව කුමක් ද?




1. තිරිඟු පිටි මිල ඉහළ යාම.
2. එළවළු මිල ඉහළ යාම.
3. සහල් සඳහා පාරිභෝගික රුචිය පහළ යාම.
4. සහල් සැපයුම ඉහළ යාම.
5. ආනයනික සහල් මිල ඉහළ යාම.

(..............)

09. බස් ගාස්තු ඉහළ නැංවීම නිසා බොහෝවින්ම සිදුවීමට ඉඩකඩ ඇති සිද්ධිය වනුයේ,

1. දුම්රිය ගාස්තු ඉහළ යාමයි.
2. දුම්රියෙන් ගමන් කරන මගීන් ප්‍රමාණය ඉහළ යාමයි.
3. පෞද්ගලික වාහන භාවිතා කිරීම ඉහළ යාමයි.
4. දුම්රිය ගාස්තු පහළ යාමයි.
5. දුම්රිය මගීන් සංඛ්‍යාව අඩුවීම.

(..............)

10. බාල භාණ්ඩයක මිල අඩුවීමක ආදායම් ප්‍රතිවිපාකය වනුයේ,

1. මිල අඩුවන විට මූර්ත ආදායම ඉහළ ගොස් ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමයි.
2. මිල අඩුවන විට මූර්ත ආදායම පහළ ගොස් ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමයි.
3. මිල අඩුවන විට මූර්ත ආදායම ඉහළ ගොස් ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමයි.
4. මිල අඩුවන විට මූල්‍ය ආදායම ඉහළ ගොස් ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමයි.
5. මිල අඩුවන විට මූර්ත ආදායම පහළ ගොස් ඉල්ලුම් ප්‍රමාණය අඩු වීමයි.

(..............)

11. සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමකට පහත සඳහන් සිදුවීම් අතරින් කවරක් හේතු විය හැකි ද?

1. සලකා බලන භාණ්ඩයේ මිල ඉහළ යාම.
2. අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම.
3. පාරිභෝගික ආදායම ඉහළ යාම.
4. රජය නිෂ්පාදන බදු පනවා හැරීම.
5. රජය නිෂ්පාදන සහනාධාර ඉවත් කිරීම.

(..............)

12. එක්තරා භාණ්ඩයක වෙළෙඳ පොළ සැපයුම් සමීකරණය QS= -20 + 4P වේ. භාණ්ඩයේ මිල රුපියල් 20.00 ක් වන විට නිෂ්පාදන අතිරික්තය වන්නේ,

1. රුපියල් 450
2. රුපියල් 600
3. රුපියල් 350
4. රුපියල් 400
5. රුපියල් 300

(..............)

13. භාණ්ඩයක මිලෙහි වෙනසක් නොමැතිව සමතුලිත ප්‍රමාණය ඉහළ යා හැක්කේ,

1. ඉල්ලුම අනම්‍ය වී සාධක මිල ගණන් ඉහළ යන විට දිය.
2. ඉල්ලුම පූර්ණ නම්‍ය වී සාධක මිල ගණන් අඩු වන විට දිය.
3. ඉල්ලුම පූර්ණ අනම්‍ය වී තාක්ෂණය දියුණු වන විට දිය.
4. සැපයුම පූර්ණ නම්‍ය වී පාරිභෝගික රුචිය අඩු වන විට දිය.
5. ඉල්ලුම පූර්ණ අනම්‍ය වී සාධක මිල ගණන් වැඩි වන විට දිය.

(..............)

14. කිසියම් භාණ්ඩයක් සඳහා වන පාරිභෝගිකයෙකුගේ පැහැදුම උපරිම විය හැක්කේ, ඉල්ලුම් නම්‍යතාව

1. ශූන්‍යයේ දී ය.
2. අපරිමිතයේ දී ය.
3. නම්‍ය වන විට දී ය.
4. අනම්‍ය වනවිට දී ය.
5. ඒකීය වන විට දීය.

(..............)

15. කිසියම් භාණ්ඩයක සැපයුම් නම්‍යතාව 0.4 ක් සහ මිල ඉල්ලුම් නම්‍යතාව -0.2 ක් වේ. මෙම භාණ්ඩය මත රජය රුපියල් 6.00 ක ඒකක බද්දක් පැන වී නම් නිෂ්පාදකයා දරන බදු බර වන්නේ,

2. රුපියල් 6 කි.
3. රුපියල් 2 කි.
4. රුපියල් 3 යි.
5. රුපියල් 5 යි.

(..............)


16. වෙළෙඳ පොළ සාර්ථකම නිමැවුම ඉක්මවූ අධි නිෂ්පාදනයක් ඇති වීමට පහත සඳහන් රජයේ ක්‍රියාමාර්ග අතුරින් කවරක් බලපානු ලැබේ ද?

1. උපරිම මිල නියම කිරීම හා අවම මිල නියම කිරීම.
2. නිෂ්පාදිත බදු පැනවීම හා සහනාධාර සැපයීම.
3. උපරිම මිල නියම කිරීම හා සහතික මිල නියම කිරීම.
4. අවම මිල නියම කිරීම හා නිෂ්පාදන සහනාධාර සැපයීම.
5. නිෂ්පාදන සලාක නියම කිරීම හා බදු පැනවීම.

(..............)

17. කිසියම් භාණ්ඩයක් සඳහා උපරිම මිල නියම කිරීමක් පහත දැක්වෙන ප්‍රස්තාර සටහනෙන් පෙන්නුම් කෙරේ.

භාණ්ඩය කළුකඩ මිලට ($P_3$) අලෙවි වූයේ නම් පාරිභෝගික අතිරික්තය පෙන්නුම් කෙරෙන කොටස වන්නේ,




1. A
2. F
3. A + B + C
4. A + B + E
5. C + D

(..............)

18. එක්තරා භාණ්ඩයකට රජය විසින් ඒකක සහනාධාරයක් සැපයූ විට නිෂ්පාදකයාගේ අයභාරය වෙනස් නොවන අතර, පාරිභෝගික අතිරික්තය රජය ලබාදෙන සහනාධාරයේ ප්‍රමාණයෙන්ම ඉහළ යන ලදී. මෙම භාණ්ඩය සඳහා පැවති ඉල්ලුම හා සැපයුම් නම්‍යතාවන් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

| ඉල්ලුම් නම්‍යතාව | සැපයුම් නම්‍යතාව |
|---|---|
| 1. පූර්ණ නම්‍ය | නම්‍ය |
| 2. පූර්ණ නම්‍ය | පූර්ණ අනම්‍ය |
| 3. ඒකීය නම්‍ය | පූර්ණ අනම්‍ය |
| 4. පූර්ණ අනම්‍ය | පූර්ණ නම්‍ය |
| 5. අනම්‍ය | නම්‍ය |

(..............)

19. රුපියල් 5.00 ක ඒකක සහනාධාරයක් ලබා දීමෙන් පසු වෙළෙඳ පොළේ සැපයුම් සමීකරණය $Qs = 10 + 2P$ වේ නම්, සහනාධාරය ලබා දීමට පෙර වෙළෙඳ පොළ සැපයුම් සමීකරණය වන්නේ,

1. $Qs = 5 + 2P$ වේ.
2. $Qs = 10 + 7P$ වේ.
3. $Qs = 5P$ වේ.
4. $Qs = 2 + 5P$ වේ.
5. $Qs = 2P$ වේ.

(..............)

20. සේවා සම්බන්ධයෙන් ගත්කල විරැකියාව වැනි ගැටළු මතුවන්නේ,

1. නිෂ්පාදනය මත බදු පැනවූ විට ය.
2. නිෂ්පාදන සහනාධාර ඉහළ නැංවූ විට ය.
3. උපරිම මිල සීමා පැන වූ විට ය.
4. අවම මිල සීමා පැන වූ විට ය.
5. නිෂ්පාදකයන් මත සලාක නියම කළ විට ය.

(..............)

21. පහත පිරිවැය අතුරින් ස්ථාවර පිරිවැයක් මෙන්ම වක්‍ර පිරිවැයක් ද වන විචල්‍යය කුමක් ද?

1. අමුද්‍රව්‍ය මිල දී ගැනීම.
2. ප්‍රාමාණික ලාභ
3. ශ්‍රමිකයින්ට වැටුප් ගෙවීම.
4. රක්ෂණ වාරික ගෙවීම.
5. ප්‍රාග්ධන සඳහා පොලී ගෙවීම.

(..............)

22. පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය කවරේ ද?

1. කෙටි කාලයේ දී නිමැවුම් ඒකක ප්‍රමාණය වැඩි වන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් හීන වේ.
2. කෙටි කාලයේ දී නිමැවුම ඉහළ මට්ටම්වල දී මුළු විචල්‍ය පිරිවැය වැඩි වන වේගයකින් ඉහළ නගී.
3. කෙටි කාලයේ දී සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය සෑම විටම සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට පහළින් පිහිටයි.
4. දිගු කාලයේ දී නිෂ්පාදනය වැඩි කිරීමෙහිලා බලපාන කිසිදු සංරෝධකයක් දක්නට නොමැත.
5. දිගු කාලයේ දී නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵල වශයෙන් පරිමාණානුකූල පිරිමැසුම් මෙන්ම නොපිරිමැසුම් ද හට ගනී.

(..............)

23. ඒකාධිපති සහ ඒකාධිකාර තරග යන වෙළෙඳ පොළ ව්‍යුහයන් දෙකට ම පොදු වූ ලක්ෂණය වන්නේ, පහත ඒවායින් කවරක්ද?

1. නිෂ්පාදිතය ප්‍රවිශේෂී වීම.
2. ප්‍රවේශයට බාධා පැවතීම.
3. ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වීම.
4. දිගු කාලයේ දී ආයතනයක ප්‍රමාණික ලාභ පමණක් ලැබිය හැකි වීම.
5. සාධක සංචලතාවයට බාධා පැමිණීම.

(...............)

24. පූර්ණ තරගය, ඒකාධිකාරය, ඒකාධිකාරී තරගය සහ කතිපයාධිකාරය යන වෙළෙඳපොළ තත්වයන්ට අදාළ උදාහරණ ශ්‍රී ලංකාව ඇසුරෙන් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1. රූපවාහිනී සමාගම්, බාබර් සාප්පු, වී ගොවිතැන, ගෑස් සමාගම්
2. පුවත් පත් සමාගම්, සිල්ලර කඩ, ජලසම්පාදනය, වානිජ බැංකු
3. වී ගොවිතැන, දුම්රිය සේවාව, ආපන ශාලා, ගෑස් සැපයුම
4. බඩ ඉරිඟු වගාව, ගෑස් සැපයුම, විදුලි බල සැපයුම, රක්ෂණ සමාගම්
5. ආපන ශාලා, දුම්රිය සේවාව, වී ගොවිතැන, වානිජ බැංකු


(...............)

25. පූර්ණ තරග ව්‍යාපාර ආයතනයක් දිගු කාලයේ දී ප්‍රමාණික ලාභ පමණක් ඉපයීමට මූලික හේතුව වන්නේ පූර්ණ තරගකාරී වෙළෙඳ පොළක,

1. පැවරුණු මිලක් පැවතීම යි.
2. සමජාතීය භාණ්ඩ නිපදවීම යි.
3. අබාධ ප්‍රවේශයක් හා පිටවීමක් පැවතීම යි.
4. මිල, ආන්තික පිරිවැයට සමාන වීම යි.
5. ආයතන ප්‍රචාරණයේ නොයෙදීම යි.

(...............)

26. එක්තරා නිෂ්පාදන ආයතනයකට අදාල කෙටි කාලීන පිරිවැය වක්‍ර දෙකක් පහත රූප සටහනෙහි දැක්වේ.




ඉහත රූප සටහනෙහි a – b ලම්භක දුරෙන් දැක්වෙන්නේ,

1. සාමාන්‍ය ස්ථාවර පිරිවැයයි.
2. සාමාන්‍ය ආන්තික පිරිවැයයි.
3. සාමාන්‍ය විචල්‍යය පිරිවැයයි.
4. සාමාන්‍ය අවස්ථිත පිරිවැයයි.
5. සාමාන්‍ය මුළු පිරිවැයයි


(...............)

27. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අදාලව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ආන්තික ඵලදාව පහළ යන විට ඊට වඩා වැඩි වේගයකින් සාමාන්‍ය ඵලදාව පහළ වැටේ.
2. සාමාන්‍ය ඵලදා වක්‍රයේ මැවුම මගින් ආන්තික ඵලදාව නිරූපණය වේ.
3. සාමාන්‍ය ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව ශුන්‍ය වේ.
4. සාමාන්‍ය ඵලදාව පහළ යන්නේ ආන්තික ඵලදාව පහළ යන වේගයට වඩා අඩු වේගයකිනි.
5. පැම විචල්‍ය යෙදවුමක දීම සාමාන්‍ය ඵලදාවට වඩා ආන්තික ඵලදාව ඉහළින් පිහිටයි.

(..............)

28. පහත දැක්වෙන්නේ කල්පිත වෙළෙඳ පොළ ආර්ථිකයක ව්‍යාපාර චක්‍රයකි.




ඉහත රූප සටහන අනුව, නිමැවුම A ලක්ෂයේ සිට B ලක්ෂයට මාරු වේ නම් නිවැරදි පිළිතුර ඇතුළත් කාණ්ඩය වනුයේ කුමක් ද?

| | අවධිය | සේවා නියුක්තිය | නිමැවුම් පරතරය | සමාහාර ඉල්ලුම |
|---|---|---|---|---|
| 1. | පසු බැසීම. | වැඩි වේ. | සෘණ | අඩු වේ. |
| 2. | උත්පාතය. | අඩු වේ. | ධන | අඩු වේ. |
| 3. | පසුබැසීම. | අඩු වේ. | සෘණ | වැඩි වේ. |
| 4. | ප්‍රසාරණය. | වැඩි වේ. | ධන | අඩු වේ. |
| 5. | පසුබැසීම. | අඩු වේ. | සෘණ | අඩු වේ. |

(..............)

29. දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වන ඵලදායි ආර්ථික කටයුත්ත වන්නේ කුමක් ද?

1. ඉගෙනීම හා විනෝදය
2. ජලාශයක පාලනයකින් තොරව ජනනය වන මත්ස්‍ය තොගය
3. ගෙවීමකින් තොරව නිවස තුළ ඉටු කරන ලද ගෘහ සේවය
4. මිනිස් මැදිහත් වීමක් යටතේ පවත්වාගෙන යනු ලබන මිරිදිය මත්ස්‍ය වගාව
5. නිවසක සාමාජිකයින් තම දරුවන් අධ්‍යාපන කටයුතු වලට පාසලට රැගෙන යාම.

(..............)

30. යම් වර්ෂයක උද්ධමන වේගය 3% කි. ජනගහන වර්ධනය 1% කි. ඒක පුද්ගල මූර්ත දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය 0% කි. නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වනුයේ,

1. 1% කි.
2. 1.5% කි.
3. 2% කි.
4. 3% කි.
5. 4% කි.

(..............)

31. ජාතික ගිණුම් වලට අදාල පහත සඳහන් ප්‍රකාශ වලින් එකඟවිය නොහැකි ප්‍රකාශය වන්නේ,

1. සියලුම ආර්ථික ඒකකවල පරිපූර්ණ එකතු කළ අගය මූලික මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය වේ.
2. මූලික මිලට භාණ්ඩ මත නිෂ්පාදකයාට පනවන බදු එකතුකොට සහනාධාර ඉවත් කිරීමෙන් ලැබෙන මිල නිෂ්පාදක මිල වේ.
3. මූලික මිලට භාණ්ඩ මත නිෂ්පාදකයාට පනවන ලද බදු එකතු කොට සහනාධාර ඉවත් කිරීමෙන් ලැබෙන මිල ගැනුම්කරුවන්ගේ මිල වේ.
4. වෙළෙඳ පොළක් නොමැති භාණ්ඩ හා සේවා වල වටිනාකම පිරිවැය පදනම් කොට ගෙන ජාතික ගිණුම් වලට ඇතුළත් කෙරේ.
5. ගැනුම්කරුවන්ගේ මිල හෙවත් පාරිභෝගික මිල, නිෂ්පාදක මිලට අඩුකරගත නොහැකි VAT බදු, ප්‍රවාහන ගාස්තු, වෙළෙඳ ආන්තික සහ ගැනුම්කරුවන් මත වෙළෙඳුන්ට පනවන ලද ශුද්ධ බදු ගැලපීමෙන් සැකසෙයි.

(.................)

32. එක්තරා වර්ෂයක දළ ජාතික ආදායම දළ දේශීය නිෂ්පාදිතයට වඩා රුපියල් දශ ලක්ෂ 10 කින් අඩු විය. මෙමඟින් ඔබට එළඹිය හැකි නිගමනය කුමක් ද?

1. ගෙවුම් ශේෂය ප්‍රාථමික ආදායම් ගිණුමේ රුපියල් දශ ලක්ෂ 10 ක හිඟයක් පවතී.
2. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 10 ක හිඟයක් පවතී.
3. ගෙවුම් ශේෂයේ ප්‍රාථමික ආදායම් ගිණුමේ රුපියල් දශ ලක්ෂ 10 ක අතිරික්තයක් පවතී.
4. ගෙවුම් ශේෂයේ භාණ්ඩ හා සේවා ගිණුමේ රුපියල් දශ ලක්ෂ 10 ක හිඟයක් පවතී.
5. ශුද්ධ විදේශීය ආයෝජන රුපියල් දශ ලක්ෂ 10 ක අතිරික්තයක් පවතී.

(.................)

33. එක්තරා ආර්ථිකයක පහත තොරතුරු ඔබට සපයා ඇත. (රු.මිලියන)

| | | |
|---|---|---|
| ශුද්ධ අපනයන | - | - 3050 |
| සේවා ගිණුම (ශුද්ධ) | - | 250 |
| ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ) | - | -380 |
| ද්විතික ආදායම් ගිණුම (ශුද්ධ) | - | - 1300 |
| දළ දේශීය වියදම | - | 10000 |
| මූල්‍ය නොවන වත්කම් (ශුද්ධ) | - | 250 |

අහස ආර්ථිකයේ වෙළෙඳ මිලට වැයකළ හැකි දළ ජාතික ආදායම වනුයේ,

1. රුපියල් මිලියන 5670
2. රුපියල් මිලියන 6570
3. රුපියල් මිලියන 5270
4. රුපියල් මිලියන 13300
5. රුපියල් මිලියන 6190

(.................)

34. $45^0$ රේඛාව පරිභෝජන ශ්‍රිතය ඡේදනය කරන විට කුටුම්භ,

1. තමන්ගේ වැය කළ හැකි ආදායම සම්පූර්ණයෙන් ඉතිරි කරයි.
2. තමන්ගේ වැය කළ ආදායම ඉක්මවා පරිභෝජනය කරයි.
3. තමන්ගේ ආදායමෙන් කොටසක් ඉතිරි කරයි.
4. තම වැයකළ හැකි ආදායම සම්පූර්ණයෙන්ම පරිභෝජනයට වැය කරයි.
5. සෘණ ඉතුරුම් (අපඉතිරිය) ඇති කර ගනී.

(.................)

35. එක්තරා ආර්ථිකයක සමාහාර ඉතුරුම් වක්‍රය දිගේ පහළට ගමන් කරන විට ආන්තික ඉතුරුම් නැඹියාවට (MPS) සහ සාමාන්‍ය ඉතුරුම් නැඹියාවට (APS) කුමක් සිදු වේද?

| MPS (ආන්තික ඉතුරුම් නැඹියාව) | APS (සාමාන්‍ය ඉතුරුම් නැඹියාව) |
|---|---|
| 1. නොවෙනස්ව පවතී. | පහළ වැටේ. |
| 2. පහළ වැටේ. | ඉහළ නගී. |
| 3. ඉහළ නගී. | පහළ වැටේ. |
| 4. ඉහළ නගී. | ඉහළ නගී. |
| 5. නොවෙනස්ව පවතී. | ඉහළ නගී. |

(..............)

36. එක්තරා සරල ආර්ථිකයක වැයකළ හැකි ආදායම රුපියල් 2000 දී සාමාන්‍ය පරිභෝජන නැඹියාව (APC) 0.8 ක් වන අතර, වැය කල හැකි ආදායම රුපියල් 4000 දී සාමාන්‍ය පරිභෝජන නැඹියාව (APC) 0.7 කි. මෙම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය වනුයේ,

1. C = 400 + 0.4 Y
2. C = 400 + 0.8 Y
3. C = -400 + 0.4Y
4. C = 400 + 0.6 Y
5. C = 400 + 0.7 Y

(..............)

37. සරල ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතයේ බෑවුම අඩුවීම නිසා ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක වනුයේ,

1. ගුණකයේ අගය වැඩිවීම හා සමතුලිත ආදායම ඉහළ යාමය.
2. ගුණකයේ අගය අඩුවීම හා සමතුලිත ආදායම ඉහළ යාමය.
3. ගුණකයේ අගය අඩුවීම හා සමතුලිත ආදායම පහළ යාමය.
4. ගුණකයේ අගය වැඩිවීම හා සමතුලිත ආදායම පහළ යාමය.
5. ගුණකයේ අගය වැඩිවීම හා සමතුලිත ආදායම ස්ථාවරව පැවතීමය.

(..............)

38. රජයේ කටයුතු ඇතුළත් සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය පහත පරිදි වේයි.

C = 100 + 0.8 YD රජයේ ස්ථාවර බද්ද රුපියල් මිලියන 40 කින් වැඩි වේ යැයි සිතන්න. සංක්‍රාම ලබාදීමක් සිදු නොවේ නම්,

1. ප්‍රායෝගික පරිභෝජනය රුපියල් මිලියන 68 කි.
2. ප්‍රායෝගික පරිභෝජනය රුපියල් මිලියන 116 කි.
3. ප්‍රායෝගික පරිභෝජනය රුපියල් මිලියන 126 කි.
4. ප්‍රායෝගික පරිභෝජනය රුපියල් මිලියන 132 කි.
5. ප්‍රායෝගික පරිභෝජනයට බද්ද පෙළඹවුණු පරිභෝජනයට බලපෑමක් ඇති නොවේ.

(..............)

39. වාණිජ බැංකුවක් මුදල් මවනුයේ,

1. තමන් සතු අධි සංචිත ණයට දීමෙනි.
2. වැඩි වැඩියෙන් චෙක්පත් මුද්‍රණය කිරීමෙනි.
3. නව පුරුකුම්පත් අලෙවි කිරීමෙනි.
4. තම සංචිත ඉහළ නංවා ගැනීමෙනි.
5. තමන් සතු සංචිත වලින් පුරුකුම්පත් මිලදී ගැනීමෙනි.

(..............)

40. පහත සඳහන් දෑ අතුරින් වාණිජ බැංකුවක වගකීමක් ලෙස සලකනුයේ,

1. අතැති මුදල්
3. මහ බැංකුවේ ඇති තැන්පතු
4. බැංකු අයිරා
5. වට්ටම් කළ වාණිජ බිල්පත්

(..............)

41. ආර්ථිකයක් පිළිබඳ කල්පිත දත්ත පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන වලින්)

| | | |
|---|---|---|
| මුදල් සැපයුම | = | 9000 |
| අධිබලැති මුදල් ප්‍රමාණය | = | 3000 |
| මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | = | 4500 |

මෙම ආර්ථිකයේ මුදල් ගුණකයේ අගය.

1. 1.2
2. 1.5
3. 2
4. 3
5. 4.5

(..............)

42. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගුණාත්මක ණය පාලන ක්‍රම අතරට ඇතුළත් වන අයිතමය වන්නේ,

1. නියත තැන්පතු පහසුකම් අනුපාතිකය.
2. විවෘත වෙළෙඳපොළ කටයුතු.
3. ණය පිළිබඳ ප්‍රමාණාත්මක සීමා නියම කිරීමය.
4. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා නියම කිරීමය.
5. නියත ණය පහසුකම් අනුපාතිකය.

(..............)

43. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් නොවන්නේ,

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව.
2. සමූපකාර ග්‍රාමීය බැංකුව
3. සණස සංවර්ධන බැංකුව
4. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
5. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

(..............)

44. පහත සඳහන් දෑ අතුරින් ද්‍රවශීලතාව අවම වත්කම වනුයේ,

1. ඉතුරුම් තැන්පතු ය.
2. භාණ්ඩාගාර බිල්පත් ය.
3. ආණ්ඩුවේ පිළිනයන් ය.
4. ඉඩම් හා ගොඩනැගිලි ය.
5. ඉල්ලුම් තැන්පතු ය.

(..............)

45. උද්ධමනය යනු.

1. පොදු මිල මට්ටමෙහි පහළ වැටීම.
2. භාණ්ඩ මිල ඉහළ යාම.
4. දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම.
5. පොදු මිල මට්ටම අඛණ්ඩව ඉහළ යාම. (..........)

46. නාමික පොලී අනුපාතිකය 9% ක් ද, උද්ධමන අනුපාතිකය 4% ක් ද වේ නම්, මූර්ත පොලී අනුපාතිකය.

1. 36%
2. 13%
3. 5%
4. -5%
5. 2.25% (..............)

47. ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටමෙහි වෙනස්කම් දැක්වීමෙහිලා වර්තමානයේ යොදා ගැනෙන මිනුමක් නොවන්නේ.

1. මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය
2. ජාතික පාරිභෝගික මිල දර්ශකය
3. කොළඹ පාරිභෝගික මිල දර්ශකය
4. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය
5. නිෂ්පාදකයාගේ මිල දර්ශකය (..............)

48. ආණ්ඩුව ඇතැම් ගුණ සාධන භාණ්ඩ නොමිලේ සපයනුයේ.

1. අඩු ආදායම්ලාභීන්ට එබඳු භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාවක් නොමැති නිසා ය.
2. ගුණ සාධන භාණ්ඩ වෙළඳපොළ ඔස්සේ සැපයිය නොහැකි නිසාය.
3. එබඳු භාණ්ඩ සැපයීමේ ඍණ බාහිරතා පවතින නිසා ය.
4. එවා නිපදවිය හැක්කේ ආණ්ඩුවට පමණක් නිසා ය.
5. එම භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ නිසා ය. (..............)

49. ආර්ථික පසුබැසීමකට මුහුණපා සිටින විට ආර්ථිකයේ නිෂ්පාදනය වැඩි කිරීමට වැදගත් වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වනුයේ,

1. පෞද්ගලික ආදායම් බදු ඉහළ දැමීම ය.
2. ආනයන සීමා කිරීමය.
3. ආණ්ඩුවේ වියදම් වැඩි කිරීමය.
4. ආණ්ඩුවේ වියදම් කපා හැරීමය.
5. මහ බැංකුව විවෘත වෙළඳපොළෙහි සුරැකුම්පත් අලෙවි කිරීම ය.

(..............)

50. පහත සඳහන් දෑ අතුරින් පොදු සම්පත්වලට අයත් වන්නේ කුමක් ද?

1. මුහුදු වෙරළ
2. උද්‍යාන
3. පාලම්
4. පරිසරයේ ගුණාත්මකබව
5. වායු ගෝලය (..........)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව<br>Economics -II | 21 S II | කාලය පැය තුනයි<br>03 hours |

'අ' උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

"අ" කොටස

01. i. ආර්ථිකයක නිෂ්පාදන සම්පත් කෙසේ වර්ග කරන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රම සම්පතෙහි ලක්ෂණ දක්වා එහි ප්‍රමාණය තීරණය කරන සාධක කවරේ දැයි දක්වන්න. (ලකුණු 04)

iii. ආර්ථික යථිතල පහසුකම් සහ සමාජ යටිතල පහසුකම් අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

iv. වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණය ලෙස මිලෙහි කාර්ය භාරය කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. විධාන ආර්ථිකය හා වෙළෙඳ පොළ ආර්ථිකය අතර දක්නට ලැබෙන වෙනස්කම් මොනවාද? (ලකුණු 04)

02. i. භාණ්ඩයක මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවීමක ආදායම් ප්‍රතිවිපාකය සහ බාල භාණ්ඩයක මිල අඩුවීමක ආදායම් ප්‍රතිවිපාකය අතර වෙනස කුමක් ද? (ලකුණු 02)

iii. එක්තරා වර්ෂයක වී නිෂ්පාදනයට අදාළ ඉල්ලුම හා සැපයුම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

$Qd = 200 - 2P$　　　　$Qs = 100$

අ) වෙළෙඳ පොළ සමතුලිත මිල කොපමණ ද? (ලකුණු 02)

ආ) නියගය හේතුවෙන් වී වල සැපයුම $Qs = 60$ ලෙස වෙනස් වුයේ නම් නව සමතුලිත මිල කොපමණ ද? (ලකුණු 02)

ඇ) අ, ආ කොටස් වලට අදාළ වෙළෙඳ පොළ සමතුලිත අවස්ථා ප්‍රස්ථාර සටහනක ලකුණු කරන්න. (ලකුණු 04)

ඉ) සැපයුම වෙනස්වීම නිසා පාරිභෝගික අතිරික්තයේ ඇති වූ වෙනස කොපමණ ද? (ලකුණු 02)

ඊ) නිෂ්පාදකයාගේ අපහාරයේ ඇති වූ වෙනස කොපමණ ද? (ලකුණු 02)

iv. භාණ්ඩයක සැපයුම් නම්‍යතාවය තීරණය කරන සාධක කවරේද? (ලකුණු 02)

03. i. කිසියම් රටක දුම්පානයට තරුණ පරපුර බහුලව ඇබ්බැහි වී ඇතැයි සිතන්න. මෙය පාලනය කිරීමේ ක්‍රියා මාර්ගයක් ලෙස සිගරට් නිෂ්පාදනය මත රජය ඒකක බද්දක් පැනවීමට තීරණය කර ඇත. සිගරට් වෙළඳ පොළේ ඉල්ලුම් සැපයුම් තත්ත්වයන්ට අදාළ දත්ත පමණක් මතු දැක්වේ.

| මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක මිලියන) | ඉල්ලුම්ප්‍රමාණය (ඒකක මිලියන) |
|---|---|---|
| 10 | 20 | 60 |
| 40 | 80 | 00 |

අ) ඉහත වගුවේ දත්ත ඇසුරෙන් සිගරට් වෙළෙඳ පොළේ පවතින ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගන්න. (ලකුණු 02)

ආ) සමීකරණ ඇසුරින් බද්දට පෙර සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

ඉ) රජය සිගරට් ඒකක් මත රුපියල් 5 ක බද්දක් පැනවීමට තීරණය කළේ නම් බද්දෙන් පසු සැපයුම් සමීකරණය ගොඩනගන්න. (ලකුණු 02)

ඊ) බද්දෙන් පසු සිගරට් අලෙවියට කුමක් සිදුවේද, යන්න සංඛ්‍යාත්මකව ගණනය කොට දක්වන්න. (ලකුණු 02)

උ) සිගරට් ඒකක් මත පනවන ලද ඒකක බද්දේ බර නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර කෙසේ බෙදී යනු ඇද්ද? එලෙස බෙදී යාමට හේතුව කවරේද? (ලකුණු 02)

ii. ගොවීන්ගේ මිල ස්ථායීකරණ වැඩ පිළිවෙලක් ලෙස "නිෂ්පාදකයින් මත සලාක නියම කිරීම" යනු කුමක් දැයි උචිත රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. ආණ්ඩුවක් විසින් භාණ්ඩයක් හෝ සේවාවක් සම්බන්ධයෙන් සිදුකරන සඵල උපරිම මිල සීමා නියම කිරීමක් රූප සටහනක් මගින් දක්වා එවැනි සඵල උපරිම මිල සීමා නියම කිරීමක් නිසා වෙළෙඳ පොළේ හටගත හැකි ප්‍රතිවිපාක සඳහන් කරන්න. (ලකුණු 04)

iv. අවම මිල සහතික මිලක් සේ සලකමින් නිෂ්පාදකයා ආරක්ෂා කරගනිමින් නිෂ්පාදකයන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා රජයක් අනුගමනය කරන මිල ආධාරක ප්‍රතිපත්ති ස්වරූප දෙක කවරේද? (ලකුණු 02)

04. i. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය දැයි දක්වා ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

අ) මුළු නිෂ්පාදිතය විචල්‍ය යෙදවුම් වලින් බෙදීමෙන් ආන්තික නිෂ්පාදිතය ලබා ගත හැකි ය.

ආ) ආර්ථික විද්‍යාත්මකව නිෂ්පාදන පිරිවැයට අයත් පිරිවැය ගැටළුවකි.

ඉ) ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා ආයතනයක් දරන ලද පිරිවැය ගිලුණු පිරිවැයකි.

ඊ) කෙටිකාලීන පිරිවැය වක්‍ර පරිමාණානුකූල ඵල නීතියේ පිළිබිඹුවකි.

(ලකුණු 08)

ii. පූර්ණ තරඟය හා ඒකාධිකාරය යන වෙළෙඳ පොළ ව්‍යුහයන් දෙක අතර පවතින මූලික වෙනස්කම් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. පූර්ණ තරඟකාරී ආයතනයක් අලෙවිකරණ භාණ්ඩ ඒකකයක මිල රුපියල් 20 කි. එම භාණ්ඩ ඒකකයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය රුපියල් 04 ක් ද, සාමාන්‍ය විචල්‍ය පිරිවැය රුපියල් 08 ක් ද වේ. මෙම ආයතනය භාණ්ඩ ඒකක 100 ක් අලෙවි කළේ නම්, උපයිය හැකි ආර්ථික ලාභය ගණනය කරන්න.

(ලකුණු 04)

iv. සාධක වෙළෙඳ පොළේ සිසියම් සාධකයක, මුළු ඉපයුම් ආර්ථික බද්ද කුලියෙන් සමන්විත වන තත්වයක් රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

05. i)

(අ) ආදායම් මූලාශ්‍ර යටතේ එකතු කළ අගය ගණන් බලන්නේ කෙසේ ද? (ලකුණු 02)

(ආ) ප්‍රාථමික යෙදවුම්, අතරමැදි යෙදවුම් වලින් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 02)

(ඉ) නව ජාතික ගිණුම් කරන ක්‍රම වේදය යටතේ 'නිෂ්පාදන ඉම' යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02)

ii) ජාතික ආදායම ගණනය කිරීමේ දී පහත දක්වා ඇති දෑ අතුරින් කවරක් ඇතුළත් කරන්නේද? ඒ ඒ කරුණ ඇතුළත් කිරීමට හෝ නොකිරීමට හේතු පැහැදිලි කරන්න.

(අ) වසර 5 ක කාලයක් තුළ මැද පෙරදිග රැකියාවක නිරතව සිටි ශ්‍රී ලාංකිකයෙකුගේ වැටුප

(ආ) සෞදි අරාබියේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවය කරන ශ්‍රී ලාංකිකයෙකුගේ වැටුප

(ඉ) ඉන්දියාවේ විශ්ව විද්‍යාලයක මාස හයක කාලයක් උපදේශක සේවා සැපයීමෙන් ශ්‍රී ලංකාවේ මහාචාර්යවරයෙකු ලබන උපදේශන ගාස්තු

(ලකුණු 02 x3 = 06)

iii) කල්පිත ආර්ථිකයකට අදාළ සත්‍ය ආර්ථික තොරතුරු රුපියල් මිලියන වලින් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජනය | - | 3500 |
| රජයේ මිලදී ගැනීම | - | 2500 |
| දළ ආයෝජනය | - | 1200 |
| වටිනා දෑහි වෙනස්වීම (රන්, පිදී... | - | 100 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | - | 900 |
| අපනයන | - | 800 |
| ශුද්ධ වක්‍ර බදු | - | 50 |
| ශුද්ධ අපනයන | - | -400 |
| ප්‍රාථමික ආදායම් ගිණුම් ශුද්ධ (විදේශ ශුද්ධ සාධක ආදායම්) | - | 100 |
| ගෙවුම් ශේෂයේ ද්විතීක ආදායම් ගිණුම් ශුද්ධ (විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම) | - | 300 |
| ශුද්ධ විදේශීය පෞද්ගලික වර්තන සංක්‍රාම | - | 250 |

අදාළ දේ පමණක් හඳුනාගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ආර්ථිකයේ දළ දේශීය වියදම (ලකුණු 02)

(ආ) වෙළෙඳ මිල යටතේ දළ දේශීය නිෂ්පාදනය (ලකුණු 02)

(ඇ) වෙළෙඳපොළ මිල යටතේ දළ ජාතික ආදායම (ලකුණු 02)

(ඈ) දේශීය ඉතුරුම් (ලකුණු 02)

## "ආ" කොටස

06. අ) කල්පිත සරල ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත සමහරක් පහත දැක්වේ.

| වැය කළ හැකි ආදායම (Yd) (රුපියල් මිලියන) | පරිභෝජනය (C) (රුපියල් මිලියන) |
|---|---|
| රු. මි. 600<br>රු. මි. 1000 | 540<br>860 |
| ස්වායත්ත ආයෝජනය (I) | රු. මි. 160 කි. |

(අ) සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 03)

(ආ) ආයෝජන ගුණකය ගණනය කරන්න. (ලකුණු 02)

ආ) රජයේ කටයුතු ඇතුළත් එක්තරා ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව 0.6 කි. රාජ්‍ය වියදම රුපියල් මිලියන 20 කින් වැඩි කිරීමට සැලසුම් කරයි නම්,

(අ) සමතුලිත ආදායම කොපමණ වැඩිවේ ද? (ලකුණු 03)

(ආ) රජය රුපියල් මිලියන 20 ක බද්දක් අය කරයි නම්, ස්ථාවර බදු ගුණකය කොපමණ ද? සමතුලිත ආදායම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේද? (ලකුණු 03)

(ඇ) රජය රුපියල් මිලියන 20 ක බද්දක් පැනවීම හා රාජ්‍ය වියදම රුපියල් මිලියන 20 කින් වැඩිකිරීමක් එකවර ක්‍රියාත්මක කරයි නම්, ඇති වන ශුද්ධ ප්‍රතිඵලය කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ඈ) සාර්ව ආර්ථික සමතුලිතය සැම විටම ප්‍රශස්ත නිමැවුමක් නොවිය හැකි ය. සේවා වියුක්ති පරතරයක් පවතින තත්වයක් තුළ සහ පූර්ණ සේවා නියුක්තිය ඉක්මවූ තත්වයක් තුළ සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.(ලකුණු 06)

07. i. 'මුදල්', 'ආසන්න මුදල් ' හා, 'මුදල් ආදේශක' යන සංකල්ප අර්ථ කථනය කරන්න. (ලකුණු 03)

ii. හොඳ මුදලක තිබිය යුතු ලක්ෂණ සඳහන් කරන්න. (ලකුණු 04)

iii. රටක කුටුම්භ සහ ආයතන මුදල් ළඟ තබාගන්නේ ඇයි? ඔවුන් ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය කෙරෙහි පොළී අනුපාතිකය කෙබඳු බලපෑමක් කරනු ලැබේ ද? (ලකුණු 04)

iv. M2b මුදල් සැපයුමට ඇතුළත් සංරචක කවරේද? (ලකුණු 04)